# සමාජ සංශෝධනය සඳහා කබීර්ගේ කාව්‍යවල දායකත්වය

ඩබ්.සී.එම්. ප්‍රනාන්දු
හින්දී අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

---

## ABSTRACT

කබීර්දාස් හින්දී සාහිත්‍යයේ භක්ති යුගයේ පැවති විවිධ ආගමික සම්ප්‍රදායයන් අතුරින් 'නිර්ගුණ් භක්ති ධාරාවට' අයත් සුප්‍රකට කවියෙකි. මෙම යුගය වන විට භාරතයේ මුස්ලිම් පාලනය ස්ථාපිත වී තිබිණ. එකල භාරතයේ පැවති සමාජයීය විසංගති පුද්ගල සංවර්ධනයට බලපෑම් ඇති කළ ප්‍රබලතම සාධකය විය. සමස්ත සමාජය ම එහි ගිලී ගියේ ය. එම වාතාවරණයෙන් මිදීමට කිසිවෙකුටවත් නොහැකි විය. එහෙත් සමාජය දෙසට බුද්ධියේ දෑස් දල්වා සිටි කබීර්, නිද්‍රිත සමාජය අවධි කිරීමේ මහඟු ප්‍රයත්නයක් දියත් කළේ ය. භාරතීය සමාජයේ පැවති වර්ගභේද, ජාතිභේද, කුලභේද, අන්ධ විශ්වාස වැනි දෑ එම සමාජයෙන් තුරන් කර සියලු ජනතාවට සමස්ථාන හා සමාන අයිතිවාසිකම් හිමි කර දෙන සර්ව සාධාරණ සමාජයක් ගොඩ නැගීම කබීර්දාස්ගේ ඒකායන පරමාර්ථය විය. ඒ අනුව ඔහු පීඩාවට පත් සාමාන්‍ය ජනතාව එම දුක්ඛිත ජීවන රටාවෙන් මුදා ගැනීම සඳහා කවිය අවියක් කර ගනිමින් තම උපදේශනයන් ජනතාව අතරට ගෙන ගියේ ය. එම නිසා ඔහු භක්ති යුගයේ විසූ සුප්‍රකට කවියන් අතුරින් කවිත්වය අභිබවා ගිය සමාජ සංශෝධකයකු ද යන්න මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් විමර්ශනයට ලක් කෙරේ.

භක්ති සාහිත්‍යයට අයත් මුගල් පාලන යුගයේ දී පාලක පක්ෂය ඉතා සුඛෝපභෝගී ජීවිතයක් ගත කළ අතර පාලිත පක්ෂයට අයත් වූ මුස්ලිම් හා හින්දු සාමාන්‍ය ජනතාව ඉතා දුක්ඛිත ජීවිතයක් ගත කළෝ ය. ළමා විවාහ, නිරක්ෂරභාවය, වහල්කම, ජාතිවාදය, ආගමික අන්ධ විශ්වාස නමැති යදම් ජනතාවගේ ජීවිතය වඩ වඩාත් සංකීර්ණත්වයට පත් කරන්නට විය. අනෙක් අතින් හින්දු මුස්ලිම් සංස්කෘතීන් දෙකෙහි සම්මිශ්‍රණය ආගමික හා සමාජීය වශයෙන් ජාතීන් දෙක ම හුදකලා කරන්නට හේතු විය.

මෙම යුගයේ දී හින්දු, ජෛන, බෞද්ධ, පර්සියානු, යුදෙව් සහ ක්‍රිස්තියානි යන ආගම් ප්‍රධාන විය. ඊට අමතර ව ජන විශ්වාසයන්හි පදනම් වූ ඇදහිලි එක් ආගමකට පමණක් සීමා නොවී සියලු ආගම් කෙරෙහි බලපවත්වන්නට විය. මෙවන් වාතාවරණයක අතිශයින් කලකිරීමට හා පසුබෑමකට ලක් ව සිටි ජනතාව තම මානසික අස්වැසුම උදෙසා ආගමෙහි පිහිට පතන්නට උත්සුක වූහ.

ඒ අනුව කබීර්දාස් කවිය මාධ්‍යය කර ගනිමින් 'නිර්ගුණ් භක්ති සම්ප්‍රදාය' ජනතාව අතරට ගෙන ගියේ ය. ඔහු තුළ තිබූ සහජ කවීත්වය ඔහු භක්ති සාහිත්‍යයේ සුප්‍රකට කවියකු බවට පත් කළ ද, කවිය මාධ්‍යය කර ගනිමින් තම උපදේශනයන් එකල සමාජ සංශෝධනය සඳහා යොදා ගැනීම ඔහුගේ ඒකායන පරමාර්ථය විය. මේ පිළිබඳ ව අධ්‍යයනයේ දී සමාජ සංශෝධනය සඳහා කබීර්ගේ කාව්‍යවල දායකත්වය සුවිශේෂී වන බව පැහැදිලි වන කරුණකි.